# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2001/2 - 2017 ජනවාරි මස 09 වැනි සඳුදා - 2017.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 24/51(iv)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

මොටර් වාහන පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය සහ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු (203 වන අධිකාරය වූ) එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2017ක් වූ ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 01 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කුලියට පුද්ගලයන් ප්‍රවාහනය සඳහා හෝ අන්‍යාකාරයකින් වෙනත් කාර්ය සඳහා මෝටර් ට්‍රයිසිකල යොද ගනු ලබන එවැනි මෝටර් ට්‍රයිසිකලයක සෑම අයිතිකරුවකු විසින් ම යම් මගියකු විසින් ඇතුල්වීම හෝ පිටවීම වැළැක්වෙන පරිදි මෝටර් ට්‍රයිසිකලයේ මගී මැදිරියේ දකුණු පැත්තේ දෙරටුව අර්ධ වශයෙන් හෝ පූර්ණව ස්ථිර වශයෙන් වසා ඇති බවට සහතික විය යුතු ය.

(2) (අ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරකු විසින් මෝටර් ට්‍රයිසිකලයේ දකුණු පැත්තේ දෙරටුවෙන් මෝටර් ට්‍රයිසිකලයට ඇතුල්වීම හෝ පිටවීම සඳහා කිසිම මගියකුට ඉඩ ලබා නොදිය යුතු ය.

(ආ) කිසිම තැනැත්තකු මෝටර් ට්‍රයිසිකලයේ දකුණු පැත්තේ දෙරටුවෙන් මෝටර් ට්‍රයිසිකලයකට ඇතුල්වීම හෝ පිටවීම නොකළ යුතු ය.

(3) මෙම නියෝගයේ කාර්ය සඳහා වයස අවුරුදු දොළහට අඩු ළමුන් දෙදෙනෙකු එක් මගියකු වශයෙන් ගණනය කරනු ලැබිය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. යම් මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින් -

(අ) මෝටර් ට්‍රයිසිකලයක සියලු ආසනවල ආධාරක ස්ථානගත කර සවිකර තිබිය යුතු අතර, එක් එක් ආසනය ඉදිරියෙන් සෘජු රේඛාවක් ඔස්සේ එක් එක් වැඩිහිටියකු සහ ළමයෙකු වෙනුවෙන් පිළිවෙලින් අවම වශයෙන් මිලිමීටර් 382 ක සහ මිලිමීටර් 250ක ඉඩ ප්‍රමාණයක් ලබා දිය යුතු බවට ;

(ආ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරු අසුනේ ඉදිරි කෙළවර සහ උපකරණ පුවරුවේ ආසන්නතම ස්ථානයේ සිරස් තලය අතර ඇති කෙටිම දුර මිලිමීටර් 300ට වඩා අඩු නොවිය යුතු බවට ;

(ඇ) මෝටර් ට්‍රයිසිකලයක මගී අසුනේ ඉදිරි කෙළවර සහ ඉදිරි ආසනයක පිටඇන්දේ ආසන්නතම ස්ථානයේ සිරස් තලය අතර ඇති කෙටිම දුර ප්‍රමාණය මිලිමීටර් 230කට වඩා අඩු නොවිය යුතු බවට ;

(ඈ) මෝටර් ට්‍රයිසිකලයකට සවිකර ඇති එක ළඟ ඇති ආසන දෙකෙහි පිටඇන්ද අතර අවම පරතරය මිලිමීටර් 660කට වඩා අඩු නොවිය යුතු බවට ; සහ

(ඉ) එකිනෙක මුහුණලා ඇති ආසන මෝටර් ට්‍රයිසිකලයට සවි නොකළ යුතු බවට.

සහතික විය යුතු ය.

4. මෝටර් ට්‍රයිසිකලයක රියදුරු හැර වෙනත් කිසිම තැනැත්තකු රියදුරු මැදිරියේ හෝ රියදුරු ආසනයේ රැගෙන නොයා යුතු ය.

5. මෝටර් ට්‍රයිසිකලයේ වේග සීමාව 2012 ජුනි මස 22 වැනි දින අංක 1763/26 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2012 අංක 1 දරන මෝටර් රථ වාහන (වේග සීමා) නියෝගවල සඳහන් විධිවිධානවලට යටත් විය යුතු ය.

6. මෝටර් ට්‍රයිසිකලය මාර්ගයේ ගමන් කිරීමේදී මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු හෝ රියදුරු විසින් වෙනත් කිසිම තැනැත්තකුට වෙළඳ දැන්වීම්, පත්‍රිකා හෝ අත් පත්‍රිකා බෙද දීම සඳහා අවසර ලබා නොදිය යුතු ය.

7. ධාවනයේ යෙදී සිටින හෝ නවතා ඇති යම් මෝටර් ට්‍රයිසිකලයක රියදුරකු විසින් වෙනත් මාර්ග භාවිතකරුවන්ට බාධාවන හෝ පීඩාවන ආකාරයේ ශබ්දයක් ඇති කරවන යම් උපකරණයක් හෝ උපාංගයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු ය. ශබ්දය මෝටර් ට්‍රයිසිකලය තුළට පමණක් සීමා වන බවත් එහි සිටින තැනැත්තන්ට පමණක් ඇසෙන පරිදි අදහස් කළ බවත් තහවුරු කිරීමට එම ශබ්දය පාලනය කළ යුතු ය.

8. (1) මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරු හෝ රියදුරු විසින්-

(අ) මෝටර් ට්‍රයිසිකලය පදවනු ලබන රියදුරු විසින් සියලු අවස්ථාවල දී තමා විසින් පදවනු ලබන වේගය පැහැදිලිව දැකගැනීම සඳහා වේගමානය යථා පරිදි මෝටර් ට්‍රයිසිකලයට සවිකර ඇති බවට ;

(ආ) මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිය බාධා රහිතවව දර්ශනය කර ගැනීමට මෝටර් ට්‍රයිසිකලයේ රියදුරුට හැකි වන පරිදි විද්‍යුත් ලෙස හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ක්‍රියාත්මක වන වා මුවා පිස්න සවි කර ඇති බවට ;

(ඇ) වායු ටයර සවිකර ඇති සෑම මෝටර් ට්‍රයිසිකලයක් ම එම මෝටර් ට්‍රයිසිකලය මාර්ගයේ ධාවනයේ යෙදීමේ දී එම මෝටර් ට්‍රයිසිකල රෝදයට හෝ ඇක්සලයට කඩිනමින් සවිකළ හැකි වන පරිදි යටත් පිරිසෙයින් එක් අමතර රෝදයක් සහ වෙනත් උපාංග රැගෙන යා යුතු බවට සහ වෙනස් ප්‍රමාණයන් දෙකක වායු ටයර සවිකර ඇති එවැනි සෑම මෝටර් ට්‍රයිසිකලයකම සුළං පුරවන ලද එක් එක් ප්‍රමාණයේ අතිරේක ටයර අවම වශයෙන් එකක් හෝ රැගෙන යා යුතු බවට ; සහ

(ඈ) රියදුරා හා මගීන් කාලගුණික තත්ත්වයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ආවරණ සවිකර ඇති බවට.

සහතික විය යුතු ය.

(2) පහත දැක්වෙන උපාංග මෝටර් ට්‍රයිසිකලයට සවිකර ඇති බවට සහ ඒවා මනා සහ ක්‍රියාකාරී තත්ත්වයෙන් පවතින බවට මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු විසින් සහතික විය යුතු ය. -

(අ) බාහිර පිටුපස දර්ශන කණ්ණාඩි දෙක ;
(ආ) ප්‍රධාන සහ අවපාත කළ හැකි දර්ශක පහන් සහිත ප්‍රධාන ලාම්පු සහ දර්ශක ;
(ඇ) අවර හෝ නැවතුම් ලාම්පු ;
(ඈ) පැති දිසා පෙන්නුම් කිරීමේ ලාම්පු ;
(ඉ) පසුපස ධාවනය සඳහා ලාම්පු ;
(ඊ) රියදුරු මැදිරිය සහ මගී මැදිරිය සඳහා වූ අභ්‍යන්තර ලාම්පු දෙක ;
(උ) නවතා තැබීමෙ ලාම්පු ; සහ
(ඌ) නලාව.

9. යම් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා තැනැත්තන් හෝ භාණ්ඩ රැගෙන යාමේ කාර්ය සදහා මෝටර් ට්‍රයිසිකලය භාවිතා කරනු ලබන අවස්ථාවක දී-

(අ) මෝටර් වාහන පනතේ 196 වන වගන්තියේ විධිවිධාන යටතේ යෝග්‍යතා සහතිකය නිකුත් කිරීම සඳහා පළමු ලියාපදිංචියේ සිට අවුරුදු දෙකක කාලයක් ගතවීමෙන් පසුව වාර්ෂිකව මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු හෝ රියදුරු විසින් මෝටර් ට්‍රයිසිකලය පරීක්ෂා කරවා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එකී සහතිකය නිකුත් කිරීම බලාත්මක වන දිනය කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(ආ) මගීන්ට පැහැදිලිව පෙනෙන පරිදි රියදුරු අසුන පටුපස පහත දැක්වෙන තොරතුරු ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(i) ලියාපදිංචි අංකය ;
(ii) රියදුරුගේ නම සහ රියදුරු බලපත්‍ර අංකය ;
(iii) රියැදුරුගේ ඡායාරූපයක් (මිලිමීටර් 65 50 ප්‍රමාණයේ) ;
(iv) හදිසි අවස්ථාවක දැනුම් දීම සඳහා වාහනය ලියාපදිංචි වී ඇති අදළ පොලිස් ස්ථානවල දුරකථන අංක

(ඇ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරු විසින් තමා සේවයේ යෙදී සිටින සෑම අවස්ථාවක දී ම.

(i) ආචාර සම්පන්න සහ විධිමත් ආකාරයට හැසිරිය යුතු ය ;
(ii) දුම්පානය නොකළ යුතු ය ;
(iii) කුලී රථයක් ලෙස පාවිච්චි කිරීමෙන් නිදහස් කරනු ලබන තෙක් එම කාර්ය අවසන් නොකළ යුතු ය ; සහ
(iv) මගීන් විසින් අන්‍යාකාරයකින් ඉල්ලා සිටින්නේ නම් මිස, අඩුම කාලයක් තුළ යා හැකි කෙටිම මාර්ගය ඔස්සේ මගීන් ස්වකීය ගමනාන්ත කරා රැගෙන යු යුතු ය.

10. (1) කුලියට තැනැත්තන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා හෝ අන්‍යාකාරයකින් මෝටර් ට්‍රයිසිකලයක් භාවිතා කරනු ලබන සෑම මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින් සියලු අවස්ථාවල දී ක්‍රියාත්මකව පවතින ටැක්සි මීටරයක් එහි සවිකර තිබිය යුතු ය.

(2) එම ගාස්තුව ගෙවීමෙන් පසුව, තත්කාර්ය සඳහා රිසිට්පතක් නිකුත් කිරීම එම මෝටර් ට්‍රයිසිකලයේ රියදුරාගේ වගකීම වන්නේ ය. එම රිසිට් පතෙහි ගමන් කළ දුර, වාහන ලියාපදිංචි අංකය, අයකළ ගාස්තුව සහ ලබාගත් දිනය ඇතුළත් විය යුතු ය.

11. මෝටර් ට්‍රයිසිකලයේ රියදුරු විසින් සෑම ගමනක් ම අවසන් කිරීමෙන් පසුව මගියකු විසින් යම් ද්‍රව්‍යයක් අතපසුවීමකින් එහි තබා ගොස් ඇද්ද යන්න පිළිබඳව විමසා බැලීම සඳහා මෝටර් ට්‍රයිසිකලය පරීක්ෂා කර බැලිය යුතු ය. එවැනි යම් ද්‍රව්‍යයක් හමුවුනේ නම් සහ අයිතිකරු විසින් වහාම එය සොයා නොපැමිණියේ නම්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව රියදුරු විසින් එම ද්‍රව්‍ය ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් එම පොලිස් ස්ථානභාර නිලධාරියා වෙත එම ද්‍රව්‍ය භාර දී එම ද්‍රව්‍ය ලැබුණු බවට එම පොලිසියෙන් රිසිට් පතක් ලබා ගත යුතු ය.

12. මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරු විසින් එහි නිෂ්පාදක විසින් ඒ මත ලකුණු කරනු ලබන විස්තරාත්මක තොරතුරු හැර මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිපස හෝ පසුපස අකුරු, ඉලක්කම් හෝ සංඛ්‍යා ලකුණු කර නොමැති බවට සහතික විය යුතු ය.

13. 2013 ජූලි මස 31 වැනි දින අංක 1821/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2013 අංක 01 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකලය) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

14. මේ නියෝගවල ''මෝටර් ට්‍රයිසිකලය'' යන්නට (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ සඳහන් අර්ථය ම ඊට තිබිය යුතු ය.

01-727

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.